# 8 ශ්‍රේණිය චිත්‍ර කලාව

## 1.2.5. අස්වනු නෙලන ගොවි ගෙවිලියෝ.

දයාබර දුවේ පුතේ,

“අස්වනු නෙලන ගොවි ගෙවිලියෝ” ඔබ සැම කෙනෙක්ම දැක ඇති සිද්ධියක්.එනිසා මෙය පහසුවෙන් නිර්මාණය කිරීමට හැකි මාතෘකාවක්.

මුලින්ම චිත්‍රය අඳින කඩදාසිය තිරස් අතට ගන්න.



එහි මුලින්ම විවිධ මානව රූප දළසටහනකින් දක්වන්න. ඒවා විවිධ ඉරියව් වීම වැදගත්වේ.ඒ සඳහා පෙර බිම භාවිතා කරන්න.එලෙස ස්ථානගත කල මානව රූප නිවැරදි අයුරින් නිර්මාණය කරන්න.

පසුව ඈත පරිසරය නිර්මාණය කරන්න.මෙහිදී වෙල් යාය ,ගස් ඈතින් පෙනෙන කඳු පන්ති ඇඳීම සිදු කල හැක.

ඉන්පසුව චිත්‍රය වර්ණ ගන්වන්න. එහිදී ඈතින් පෙනෙන පරිසරය ලා පැහැයටත් ඉදිරිපස රූප තද වර්ණයෙන් වර්ණ ගැන්වූ විට පර්යාව ලෝකණ ලක්ෂණ ඉස්මතු වී චිත්‍රය වඩාත් අලංකාර වේ.

සැලකිය යුතුයි :- මෙය ආදර්ශයක් පමණි.ඔබට කැමති ආකාරයට රූප සංරචනය සහ වර්ණ ගැන්වීම කල හැකිය.




එච්.ටී.ඩී.ජයවර්ධන මයා

ගුරු උපදේශක (චිත්‍ර )

ගොඩකවෙල - කොට්ඨාසය